## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

### මාධ්‍ය නිවේදනය

දැනට මහජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගැනීමේදී මුහුණ දීමට සිදුවී තිබෙන අනේක විධ ගැටළු විසදා ගැනීමට අවශ්‍ය සහන ලබාදීමට රජයේ ක්ෂණික අවධානය යොමුවිය යුතු බවද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දන්වා සිටී.

එක්සත් ජාතීන්ගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ප්‍රකාරව, පාර්ශ්වකාර රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව, රට වැසියන්ට ප්‍රමාණවත් ආහාර සැපයීම සහ කුසගින්නෙන් තොරව සිටීම මූලික අයිතිවාසිකමක් ලෙස සම්මුතියට ඇතුලත් වීමේදීම පිළිගෙන ඇත. තවද මෙම කරුණු ඉටුකර ගැනීම සඳහා රටක් සතු උපරිම සම්පත් යොදා ගතයුතු බව ඉහත සම්මුතියේ වැඩිදුරටත් අවධාරණය කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් තුලින් ද මෙය වැඩිදුරටත් පෙන්වා දී ඇත. ඒ අනුව රටවැසියන්ගේ කුසගින්නෙන් තොරව සිටීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම රජයේ වගකීමක් බව අවධාරණය කරමු.

විශේෂයෙන්ම, දිනෙන් දින වැඩිවන ආහාර, ගෑස්, තෙල් වැනි පාරිභෝගික භාණ්ඩවලට සාධාරණ මිලක් සහ හිගයකින් තොරව පහසුවෙන් එම භාණ්ඩ මහජනතාවට ලබාදීම තුලින් දැනට පවත්නා උද්ඝෝෂණ ව්‍යාප්ත වීම වළක්වා ගත හැකි බවද මානව හිමිකම් කොමිෂන් සභාව විශ්වාස කරන බව රජයට අවධාරනය කර සිටී.

මෙම අර්බුදය විසඳීමට උත්සාහ කිරීමේදී ශ්‍රී ලංකාව ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කර ඇති බව බලධාරීන්ට දන්වා සිටින අතර, එම සම්මුතියට අනුව ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය ඇතුළු මූලික අත්‍යාවශ්‍ය සේවාවන්, පවතින සම්පත්වලින් උපරිමයෙන් සැපයීමට රජය බැඳී සිටන බවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරනය කර සිටී.

විනිසුරු රෝහිණී මාරසිංහ
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු / සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2022.04.20